කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

**බාහිර විභාග අංශය**

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2009**

**(2010 මැයි / ජූනි)**

**සමාජීය විද්‍යා පීඨය**

**මනෝ විද්‍යාව - PSYC -E2025**

**ව්‍යවහාරික මනෝවිද්‍යාව**

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු ලියන්න**

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි** **කාලය :පැය 03 යි**

---

01. "ව්‍යවහාරික මනෝවිද්‍යාව, න්‍යායික මනෝවිද්‍යාවේ ප්‍රායෝගික පැතිකඩ නියෝජනය කරයි, ව්‍යවහාරික මනෝවිද්‍යාව හා න්‍යායික මනෝවිද්‍යාව එකිනෙකට ප්‍රතිවිරුද්ධ ක්ෂෙත්‍ර ද්වයක් නොවේ." ව්‍යවහාරික මනෝවිද්‍යාවේ විෂය ක්ෂෙත්‍රය ඇසුරෙන් විමසීමට භාජනය කරන්න.

02. කිසියම් භූගෝලීය කලාපයක අධික ජනගහනය එහි වාසය කරන පුද්ගලයන්ගේ චර්යාව කෙරෙහි බලපාන ආකාරය පෙන්වා දෙන්න.

03. චිත්තවේග කළමනාකරණය යනු කුමක්ද? නූතන සංවිධාන චර්යාව බුද්ධි ඵලය වෙනුවට චිත්තවේග ඵලය කෙරෙහි උනන්දු වෙන්නේ ඇයි ? පැහැදිළි කරන්න.

04. අමතක වීමේ මනෝවිද්‍යාත්මක පදනම පැහැදිළි කරමින් මතකය දියුණු කිරීමේ ක්‍රම පිළිබඳ විමර්ශනයක යෙදෙන්න.

05. වරද කරුවන් පුනරුත්ථාපනයේදී ප්‍රජානනය වෙනස් කිරීමේ වැඩසටහන්වල ඇති වැදගත්කම පෙන්වා දෙන්න.

06. අහේතුවාදය ජීවිත හා සමාජ ගැටළුවලට හේතුවන ආකාරය පෙන්වා දෙන්න.

07. අයහපත් චිත්තවේග හේතුවෙන් ශාරීරික හා මානසික ගැටළු ඇතිවීමේ ජීව මනෝවිද්‍යාත්මක යාන්ත්‍රනය පැහැදිළි කරන්න.

08. මානසික ගැටළු වැළැක්වීමේ හා මානසික සෞඛ්‍යය නංවාලීමේ සේවාවක් වශයෙන් උපදේශනයේ ඇති වැදගත්කම පෙන්වා දෙන්න.

09. පුද්ගල ගැටුම් ඇතිවීමේ මනෝවිද්‍යාත්මක හේතු පැහැදිළි කරමින් ගැටුම් වැළැක්වීමේ ක්‍රමවේද හඳුන්වා දෙන්න.

10. භාවනාව කායික හා මානසික සෞඛ්‍ය වර්ධනය කිරීමට කෙසේ හේතු වෙයි ද?

*****************************